දුරකථන ) 0112669192 , 0112675011
தொலைபேசி ) 0112698507 , 0112694033
Telephone ) 0112675449 , 0112675280

ෆැක්ස් ) 0112693866
பெக்ஸ் ) 0112693869
Fax )0112692913

විද්‍යුත් තැපැල )postmaster@health.gov.lk
மின்னஞ்சல் முகவரி )
e-mail )

වෙබ් අඩවිය ) www.health.gov.lk
இணையத்தளம் )
website )

සුවසිරිපාය
சுவசிரிபாய
SUWASIRIPAYA

මගේ අංකය } NA/07/03/2023
எனது இல }
My No. }

ඔබේ අංකය }
உமது இல }
Your No. }

දිනය } 2024.01.04
திகதி }
Date }

# සෞඛ්‍ය අමාත්‍යාංශය
# சுகாதார அமைச்சு
# Ministry of Health

**<u>සිසුහෙද පුහුණුවට බඳවා ගැනීම - 2023</u>**

**<u>සම්මුඛ පරීක්ෂණ සඳහා කැඳවීම.</u>**

**2023** වර්ෂයේ සිසු හෙද පුහුණු පාඨමාලාවට සිසුන් බඳවා ගැනීම සඳහා අංක **2350** දරණ **2023.09.15** දිනැති ගැසට් නිවේදනයට අදාළව ඔබ විසින් ඉදිරිපත් කර ඇති අයදුම්පත අනුව සුදුසුකම් ලැබූ අයදුම්කරුවන්ගේ නාම ලේඛනය ඇමුණුම **01** මගින් දක්වා ඇත. ඒ අනුව ඔබගේ සුදුසුකම් පරීක්ෂා කිරීම සඳහා පවත්වනු ලබන සම්මුඛ පරීක්ෂණය **2024.01.13** දින සිට ආරම්භ වේ. එම සම්මුඛ පරීක්ෂණ පැවැත්වෙන ස්ථාන ඇතුළත් කාලසටහන අනුව **ඇමුණුම 02** මගින් දක්වා ඇති ස්ථානවලදී **පෙ.ව. 8.30** සිට පැවැත්වීමට කටයුතු සූදානම් කර ඇත.

02. ඒ අනුව ඇමුණුම **01** මගින් දක්වා ඇති නාම ලේඛනයේ ඔබට හිමි කැඳවීම් අංකය අනුව, **ඇමුණුම 02** මගින් දක්වා ඇති කාලසටහන අනුව ඔබට නියමිත දිනයේදී නියමිත ස්ථානය වෙත පහත ලිපිලේඛනවල **මුල් පිටපත්** සමඟ සත්‍ය බවට තමන් විසින් සහතික කරන ලද ඡායා පිටපත් ද රැගෙන සම්මුඛ පරීක්ෂණයට සහභාගී වන මෙන් දන්වමි. ඡායා පිටපත් සියල්ල කාඩ්බෝඩ් ලිපිගොනුවක අමුණා ඉහළ දකුණු පස ඔබගේ නම, ජාතික හැඳනුම්පත් අංකය, හා කැඳවීම් අංකය සටහන් කර සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය වෙත භාරදිය යුතු ය. සම්මුඛ පරීක්ෂණය සඳහා ඉදිරිපත් කළයුතු ලිපිලේඛන පහත පහත පරිදි වේ.

I. උප්පැන්න සහතිකය.
II. ජාතික හැඳුනුම්පත හෝ වලංගු ගමන් බලපත්‍රය හෝ වලංගු දේශීය රියදුරු බලපත්‍රය
III. ගැසට් නිවේදනයේ 7.3 ඡේදයේ සඳහන් පරිදි සහතික කරන ලද ඔබගේ අත්සනින් යුතු මුද්‍රිත අයදුම්පත. **(Print out)**
IV. අ.පො.ස. (උ.පෙළ) විභාග ප්‍රතිඵල ලේඛනය හා '**Z**' අගය දැක්වෙන සහතිකය. (විද්‍යා / ගණිත විෂය ධාරාව යටතේ 2019 වර්ෂයේ (පැරණි නිර්දේශය) හෝ (නව නිර්දේශය) හෝ 2020 වර්ෂයේ (පැරණි නිර්දේශය) හෝ (නව නිර්දේශය) විෂයන් 03කින් එකවර සමත්වීම, (සාමාන්‍ය පොදු පරීක්ෂණය හා ඉංග්‍රීසි හැර )

V. අ.පො.ස. (සා.පෙළ) විභාග ප්‍රතිඵල ලේඛනය. (**විභාග දෙපාර්තමේන්තුව විසින් නිකුත් කළ අ.පො.ස. (උ.පෙළ) / අ.පො.ස. (සා.පෙළ) විභාග ප්‍රතිඵල ලේඛන පමණක් සලකා බලනු** ලැබේ. )

VI. රු. 1,000.00 ක මුදල ගෙවූ බවට සනාථ කෙරෙන රිසිට්පත.

VII. ග්‍රාම නිලධාරි විසින් නිකුත් කරන ලද සහතිකය. **(DS 4 ආකෘතිය)**

VIII. ශිෂ්‍ය කාර්ය දර්ශනය. (පාසල් හැරයාමේ සහතිකය - අධ්‍යාපන **ඕ 59 පොදු ආකෘති පත්‍රය)**

IX. විවාහය ලියාපදිංචි කර හෝ දික්කසාද වූ හෝ අයෙකු නොවන බව සනාථ කිරීම සඳහා සාමදාන විනිශ්චයකරුවකු ඉදිරියේ රු. 50.00 ක මුද්දරයක් මත අත්සන් කරන ලද දිවුරුම් ප්‍රකාශය. **(ඇමුණුම 03)**

X. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව යටතේ පවත්නා රජයේ විශ්වවිද්‍යාලයක/රජයේ විශ්වවිද්‍යාල විද්‍යායතනයක අ.පො.ස. (උ.පෙළ) සුදුසුකම් මත උපාධි පාඨමාලාවක් හැදෑරීම සඳහා "රජයේ නිදහස් අධ්‍යාපන වරප්‍රසාද" යටතේ අභ්‍යන්තර ශිෂ්‍යයෙකු ලෙස ලියාපදිංචි වී සිටින හෝ හදාරමින් සිටින අයෙකු නොවන බවට ඔබගේ බහුමාන සහතිකය. (වෙබ් අඩවියේ පළ කර ඇති බහුමාන සහතිකය සම්පූර්ණ කර ඉදිරිපත් කළ යුතු ය. **(ඇමුණුම 04)**

XI. උක්ත ලේඛනවල සඳහන් නම්වල වෙනසක් ඇත්නම් සාමදාන විනිශ්චයකරුවකු ඉදිරියේ රු. 50.00 ක මුද්දරයක් මත අත්සන් කරන ලද දිවුරුම් ප්‍රකාශය.

03. **සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයේ නිර්දේශ මත හා අංක 2350 දරණ 2023.09.15** දිනැති ගැසට් නිවේදනයේ විධිවිධානවලට යටත්ව සිසු හෙද පුහුණුව සඳහා සුදුස්සන් තෝරා ගනු ලැබේ. **සම්මුඛ පරීක්ෂණ සඳහා සහභාගී වන සියලුම අයදුම්කරුවන් පුහුණුවට බඳවා ගන්නා බවක් මෙහි ඇතුළත් කිසිදු වගන්තියකින් අදහස් නොකෙරෙන බව සැලකිය යුතුය.** සම්මුඛ පරීක්ෂණ මගින් පුහුණුව සඳහා තෝරා ගනු ලබන අයදුම්කරුවන්ගේ නාම ලේඛනය www.health.gov.lk යන සෞඛ්‍ය අමාත්‍යාංශයේ නිල වෙබ් අඩවියේ පළකරනු ලබන අතර ඒ සම්බන්ධයෙන් කිසිම අයදුම්කරුවෙකුට පෞද්ගලිකව දැනුම් දෙනු නොලැබේ.

04. **සම්මුඛ පරීක්ෂණ පවත්වන අදාළ දිනයන්වල සියලුම අයදුම්කරුවන් අනිවාර්යයෙන් සහභාගී විය යුතු ය. සම්මුඛ පරීක්ෂණයට නියමිත දිනයන්හි දී පැමිණීමට අපොහොසත් වන අයදුම්කරුවන් නැවත සම්මුඛ පරීක්ෂණයන් සඳහා කැඳවීමට සලකා බලනු ලබන්නේ ඔහු / ඇය අසනීප තත්වයක් හේතුවෙන් පිළිගත හැකි වෛද්‍ය වාර්තා සම්මුඛ පරීක්ෂණයට කැඳවීමේ දින සිට දින 07ක් ඇතුළත සෞඛ්‍ය අමාත්‍යාංශයේ නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (පාලන) II වෙත ඉදිරිපත් කරන්නේනම් පමණක් බව කාරුණිකව දන්වමි.**

| | |
|---|---|
| **කේ.එම්. වත්සලා ප්‍රියදර්ශණී** | අත්/කළේ - **වෛද්‍ය පී.ජී. මහීපාල** |
| අතිරේක ලේකම් (පාලන) II | ලේකම් |
| | සෞඛ්‍ය අමාත්‍යාංශය. |

කේ.එම්.වත්සලා ප්‍රියදර්ශණී
අතිරේක ලේකම් (පාලන) II
සෞඛ්‍ය අමාත්‍යාංශය
"සුවසිරිපාය"
කොළඹ 10

දුරකථන ) 0112669192, 0112675011
தொலைபேசி ) 0112698507, 0112694033
Telephone ) 0112675449, 0112675280

ෆැක්ස් ) 0112693866
பெக்ஸ் ) 0112693869
Fax ) 0112692913

විද්‍යුත් තැපැල )
மின்னஞ்சல்முகவரி )postmaster@health.gov.lk
E-mail )

වෙබ් අඩවිය )
இணையத்தளம் ) www.health.gov.lk
Website )

සුවසිරිපාය
சுவசிரிபாய
SUWASIRIPAYA

සෞඛ්‍ය අමාත්‍යාංශය
சுகாதார அமைச்சு
**Ministry ofHealth**

මගේ අංකය) NA/07/03/2023
எனது இல )
My No )

ඔබේ අංකය )
உமது இல )
Your No )

දිනය ) 2024.01. 04
திகதி )
Date )

**Recruitment for the Student Nursing Training – 2023**
**Calling for the interviews**

01.This has reference with the application forwarded by you for applying to the Student Nurses Training Course in relation to the Gazette notification of 2350 dated 15.09.2023 and the list of selected applicants is attached in **Annexure 01**. Accordingly, the arrangements have been made to commence the interviews from 13.01.2024. According to that the interviews will be held on 8.30 am at the premises where mentioned in the **Annexure 02**.

02. Accordingly you are kindly informed to be present at the relevant premises as per your calling number given at the name list with the **original** documents of the followings with the photocopies which are certified to true by you. All photocopies should be fasten in a cordboard file and your Name, NIC number and the Calling number should be mentioned on the top right corner of the cardboard file.

The documents to be submitted are as follows.

I. Birth Certificate.
II. NIC or valid passport or valid Sri Lankan driving licence.
III. Print out of the application with your signature with certifying as per the paragraph no. 7.3
IV. G.C.E. (A/L) results sheet with the Z score. (Getting pass the 3 subjects at one sitting of the Science or Mathematics stream of year 2019 (Old syllabus) or (New syllabus) or getting pass the 03 subjects at one sitting of the year 2020 from the Old syllabus or New syllabus issued only by the Examination Department (Except General knowledge and English)
V. G.C.E.(O/L) results sheet ( Issued only by the Examination Department)
VI. Receipt obtained for the payment of Rs. 1,000.00
VII. Grama Niladhari Certificate (DS 4 form)
VIII. Student Performance Sheet (School Leaving Certificate - Education B 59 form)
IX. Affidavit signed over a stamp at the value of Rs. 50.00 in the presence of a Justice of Peace to confirm that the applicant is not married or divorced (**Annexture 3**)

X. Solemn Declaration to confirm the applicant is not a registered student or currently following full time / internal degree programme conducted by a State University or a State University College recognized by the University Grant Commission "under the national free education policy." (Should be completed and submitted the Solemn Declaration which is posted on the website) (**Annexture 4**)

XI. If there is name change in the above documents, need an affidavit from the Justice of Peace which is duly signed on the stamp of Rs. 50.00

03. Qualified students will be selected by the recommendation of the interview board under the Gazette notification of 2350 dated 15/09/2023. It should be strictly noted that no section contained in the Gazzette notification that you will be selected to the course applied for even faced the interview. The name list of the selected applicants will be published in the official website of http://www.health.gov.lk and do not inform you personally.

04. All the applicants should be present according to the time schedule for the interview. Please be noted that if an applicant could not present to the interview in the scheduled date due to any medical reason, he/ she should handover the acceptable Medical Certificate to the DDG Admin II at the Ministry of Health within 07 days from the interview date for next calling.

**K.M. Wathsala Priyadarshani**
Additional Secretary (Admin) II.

K.M.Wathsala Priyadarshani
Additional Secretary (Admin) II
Ministry of Health
" Suwasiripaya "
Colombo 10

Signed By- **Dr. P.G.Mahipala**
Secretary
Ministry of Health.